පොත් බෑගය ගුරුතැමියගේ අතින් ගත් සුරම්‍යා ඇය අසලින්ම ඇවිද යමින් ඇය හා කතාවට වැටුණාය.

"මොකක්ද තිලකා මිස්, අපේ ලොකු ඉස්කෝලෙ හාමිනේට වෙලා තියෙන්නෙ? මිස්ට විරුද්ධකම් කරන එකයි, පන්තියෙ අපි හැමෝටම නපුරුකම් කරන එකයි තමයි, වෙන මොකුත් කරන්න දෙයක් නෑ වගේ."

"ඕව ගනන් ගන්න එපා සුරම්‍යා. ලොකු ඉස්කෝලෙ හාමිනේටත් මොනව හරි හිතේ කරදර ඇති. ඒක නිසා වෙන්න ඇති ඔහොම කරන්නෙ. අපි ඕව ගනන් ගන්න ඕන නෑ. අපේ පාඩුවෙ අපි වැඩ කරගනිමු. ඉක්මනට යමු, අද ටිකක් පරක්කු වුණා."

තිලකා තම සිසුදැරිය ද සමග පාසලට ළඟා වන විටම පාසල පටන්ගන්නා සීනුව නාද විය. තමා පන්ති කාමරටය ඇතුල් වෙද්දී කොරිඩෝරය දිගේ ඇවිදිමින් උකුසු ඇසින් තම පන්තිය දෙස බලමින් සිටි මුල්ගුරුවරිය ඇය දුටුවාය. මුහුණේ පෙනුණ රෞද්‍ර ගතිය තමන් දවා හළු කරලන්නට තරම් සමත් වෙතියි තිලකාට සිතුණි. කිසිදු වෙනසක් නොපෙන්වා ඇය සිය රාජකාරී කටයුතු ඇරඹුවාය. විවේක කාලය තුළදී ගුරුකාමරයට පිවිසි තිලකාට එහි සිටි රත්නසේකර මහතා හමුවිය.

"තිලකා මිස්, මං කියන්න යන දේ අහලා පුදුම වෙන්න එපා. ලොකු ඉස්කෝලෙ හාමිනේට ගමේ මිනිස්සු කියන්නෙ උඩගෙදර ඉස්කෝලෙ හාමිනේ කියලා. ඒ මොකද දන්නවද? එයා ගමේදි ඉන්නෙත් අනික් අයට වඩා උඩින් ඉන්න කෙනෙක් හැටියට හිතාගෙනලු. හරි ආඩම්බරයිලු. එයා ඉගෙනගන්න ගිය තැනකදී මහ පව්කාර වැඩක් කරලා ඒකෙන් හිතෙන් විඳවනවලු. ළමයින්ට හරි නපුරුයිලු. ඒ පාපකර්මෙ දරාගන්න බැරුවලු ඔය අමුතු විදියට හැසිරෙන්නෙ. අහිංසක අයට හරියට වද දෙනවලු. ගිය ගිය තැන ඔහොමලු."

රත්නසේකර මහතා දිගටම කියාගෙන ගියේය.

"තිලකා මිස්ට දැන් තේරෙනවද එයා නිකරුණේ තිලකා මිස්ලා වගේ අහිංසක අයට වද දෙන්නෙ ඇයි කියලා? ඕක මානසික ලෙඩක්ලු. හොඳින්, සතුටෙන් ජීවත් වෙන අහිංසක අයට වෛර කරනවලු. ඊර්ෂ්‍යා කරනවලු. ගමේදිත් එහෙමලු."

"ඉතිං දෙයියනේ, ඒකට මේ මගේ පන්තියෙ ඉන්න අහිංසක දරුවො පළිද? මොකද්ද සෝමවතී ඉස්කෝලෙ හාමිනේට ඒ දරුවො එක්ක තියෙන වෛරය?"

"ඇයි තිලක මිස්, තේරෙන්නෙ නැද්ද? මිස්ගෙ පන්තියෙ වැඩ හොඳට කෙරෙනකොට, ළමයි සතුටෙන් ඉගෙනගන්නකොට, මිස්ට කාගෙත් ආදරය, ගෞරවය ලැබෙනකොට, ඒවට හරස්කපන්නනම්, පන්තියෙ ළමයින්ටත් කරදර කරන්න ඕන නේ. මම නම් අහල තියෙනවා, ඔය වගේ මානසික රෝග තියෙන අයගෙ හැසිරීම ඔය වගෙයි කියලා."

තිලකා බර කල්පනාවකට වැටුණාය. සෝමවතී ඉස්කෝලෙ හාමිනේ තම පාසලේ මුල්ගුරු තනතුරට පත් වී ආ දා පටන් සිදු වූ බොහෝ දේ ඇයගේ මතකයට නැගෙන්නට විය. නිතර නිතරම ඇය කෝපයෙන් තමන්ට බැණ වැදුණ සැටි, එම පාසලෙන් අස් වී වෙනත් පාසලකට යන්නැයි තර්ජනාත්මක ස්වරයෙන් තමන්ට කී සැටි, පාසලේ අමතර කටයුතු තමන් හොඳින් සංවිධාන කළ අවස්ථාවලදී ඒවාට බොරු වැරදි ආරෝපණය කරන්නට ඇය තැත් කළ සැටි, මේ අතීත සිදුවීම් එකින් එක තිලකාගේ මතකයට නැගෙන්නට විය.

"සර්, සර්, අන්න ළමයි වගයක් කලබල කරනවා. අම්මලා තාත්තලා ඉස්කෝලෙ වත්තට ඇවිල්ලා. පෝස්ටර් වගේකුත් උස්සගෙන. ඇවිත් බලන්න සර්. තිලකා මිස්, අනේ ගිහිං බලන්නකො මොකද්ද වෙන්නෙ කියලා." ශිෂ්‍යශිෂ්‍යාවෝ කීප දෙනෙක් ගුරු කාමරය තුළට දුව එමින්, හති දමමින් කියන්නට වූහ.

ටික වේලාවකින් මුල් ගුරුවරියගේ කාර්යාලය දෙසට ඇවිද එමින් සිටි පිරිස විශාල සංඛ්‍යාවක් විය. ඔවුන් ඔසවාගෙන සිටි පෝස්ටර්වල නානාවිධ විරෝධ පාඨ ලියා තිබුණි. "උඩගෙදර ඉස්කෝලෙ හාමිනේ, වහා පහළට බහිනු!", "අපේ දරුවන්ට වද නොදෙනු!" ආදී වශයෙන් ලියවුණ විවිධ පාඨ ඒවායේ තිබුණත් තිලකාට කියවාගත හැකි වූයේ එයින් දෙකක් පමණි.

උද්ඝෝෂණය කරමින් සිටි පිරිස මහත් කලබලයෙන් කාර්යාලය දෙසට ගමන් කරමින් සිටි ආකාරය තිලකාට පෙනිණ. කවදත් සෝමවතී ඉස්කෝලෙ හාමිනේට පක්ෂපාතීව සිටි ගුරුවරගුරුවරියන් කිසිවෙක් එහි සිටි බවක් නොපෙනුණි. මොහොතකින් විරෝධතා පෙළපාළිය මුල් ගුරුවරියගේ කාර්යාලය තුළට කඩා වැදෙනු ඇත. එවිට කුමකින් කුමක් වේදැයි තිලකාට සිතාගත නොහැකිය. මෙවැනි ආපදා තත්වයකදී තමන් එහි යාම නුවණට හුරු නොවන බව ඇයට හැඟිණ. තම අසරණ මව හා පියා ගැන ඇයට සිහිපත් විය. තමන්ට අනතුරක් වුවහොත් ඔවුන් තවත් අසරණ වනු ඇත. ඒනසා ඕනෑ දෙයක් සිදු වෙන්නට හැර මෙතනින් ඉවත් වී යා යුතු යයි ඇය සිතුවාය.

"ඒත්! ඒත්! දෙවියනේ, ඒත් ගෑනියෙක්. කොච්චර නපුරුකම් කළත්, මොනව හරි කරදරයක් වුණොත්! තවත් ගෑනියෙක් නේද දුක් විඳින්නෙ!"

තිලකාගේ සිතෙහි දෙගිඩියාව ලියලන්නට විය. පිරිස නගන උද්ඝෝෂණ හඬ එන්න එන්නම වැඩි වෙයි. ඔවුන් හා මුල් ගුරුවරිය සිටි කාර්යාලය අතර ඇත්තේ සුළු දුර ප්‍රමාණයක් පමණි.

"අම්මා! අප්පච්චි! මට මොනව හරි වුණොත්!" ඇගේ හද ගැස්ම වැඩි විය. සිටි තැනින් ඉවත් වී යාමට තැත් කළත් ඊට තම දෙපා වාරු නැතැයි ඇයට හැඟිණ.

"කමක් නෑ." සිත දැඩි කරගත් ඇය වේගවත් ගමනින් පිරිස සිටි දෙසට ගමන් කළාය. කෝපයට පත් වී සිටි පිරිස ඉදිරියෙන්ම සුරම්‍යාගේ පියා විජේදාස සිටිනු ඇය දුටුවාය. ඔහුට පිටුපසින් වූවන්ගේ වියරු පෙනුම දුටු තිලකා බියෙන් ගැහෙන්නට වූවාය. "ආපසු හැරී යා යුතුය. මෙවැනි අකාරුණික ගැහැනියකට පිහිට වන්නට ගොස් තමන්ට අනතුරක් සිදු වුවහොත් එහි පාඩුව තමන්ටමය. තම අසරණ දෙමාපියන්ටමය." තිලකාගේ හෘද ස්පන්දනය වැඩි වන්නට විය. කෝප වූ පිරිස අතින් සෝමවතී ඉස්කෝලෙ හාමිනේ අනතුරට ලක්වන අයුරු ඇයට මැවී පෙනෙන්නට විය.

"අනේ පව්! තවත් ගැහැනියක්!" ඇය තොල් මතුරන්නට වූවාය.

මොහොතකින් ඇයගේ සිතට දැඩි ශක්තියක් හා ආවේගයක් දැනුණාක් වැන්න. තිලකා වහා ක්‍රියාත්මක වූවාය. ඇය අඩියට දෙකට මුල්ගුරු කාමරය වෙතට දිව ගියාය. සෝමවතී ඉස්කෝලෙ හාමිනේ බය බිරාන්ත වී සිටියාය. වයස්ගත බව නිසා වැහැරී ගොස් තිබූ මුහුණේ එල්ලා වැටෙන සේ පෙනුණ දෙකම්මුල් සලිතව වෙමින් තිබිණ. දෙනෙත් පුරා ගලා ගිය කඳුළු කැට තිලකාට පෙනුණේ විශාල දිය බුබුළු මෙනි. ඔසරි පොට ඔසවා නාසය සූරා පිස දමාගත් ඇයගේ පෙනුම අන්ත අසරණ තත්වයක් හෙළි කළේය.

තිලකා සෝමවතී ඉස්කෝලෙ හාමිනේ ඉදිරියෙන් සිට ගත්තාය.

"කලබල වෙන්න එපා. ඔක්කොම හරි යාවි" ඇය සිහින් ස්වරයෙන් සෝමවතී ඉස්කෝලෙ හාමිනේට පැවසුවාය. ඇයගේ පෙනුමේ කිසිදු වෙනසක් නොවූ අයුරු තිලකා හොඳින් දුටුවාය. ආත්ම අනුකම්පාව හා භීතිය ඇයගේ සුපුරුදු අකාරුණික, රෞද්‍ර පෙනුම මකා දමන්නට අපොහොසත් වී තිබීම ගැන තිලකා පුදුම නොවූවාය.

"කොහොම වුණත් තවත් ගෑනියක් නේ." තිලකා සිත දැඩි කරගත්තාය. මුල්ගුරු කාමරය දෙසට පැමිණෙමින් සිටි පිරිස වෙතට හැරුණ ඇය, "පොඩ්ඩක් ඉන්න. ඔහොම පොඩ්ඩක් නවතින්න. දැන් සන්සුන් වෙන්න, සුරම්‍යගෙ තාත්තෙ, මොකද්ද ඔය අතේ තියෙන්නෙ! ඕක දාන්න බිමට. අපි පොඩ්ඩක් ඉවසමු. කලබල වෙන්න එපා. සෝමවතී ඉස්කෝලෙ හාමිනේට කිසිම කරදරයක් කරන්න එපා." කාමරයෙන් පිටත හඬනගමින් සිටි පිරිසට තිලකාගේ විධානය නෑසුණි.

"උඩගෙදර ඉස්කෝලෙ හාමිනේ, මෙහෙමද අපේ රත්තරන් දරුවන්ට සලකන්නෙ, මෙහෙමද අපේ රත්තරන් මිස්ලට සලකන්නෙ?" ගාලගෝට්ටියේ කිසිදු අඩුවක් නැත. රත්නසේකර මහතා ඇතුළු ගුරුවරගුරුවරියන් පිරිසක් කාර්යාලය දෙසට ඇවිදගෙන එනු තිලකා දුටුවාය. සෝමවතී ඉස්කෝලෙ හාමිනේ අසුන මත වාඩි කරවූ තිලකා ඇයගේ පිටට තට්ටු කරමින් ඇය අස්වැසුවාය. ඒ මොහොතේ කාර්යාලය තුළට පිවිසි නන්දනී මිස් එම දර්ශනයෙන් පුදුමයට පත් වන සැටි තිලකාට පෙනුණි. ඇය වහා කාමරයෙන් පිටතට ගොස් රැස්ව සිටි පිරිස සන්සුන් කරවන්නට උත්සාහ දැරුවාය. රත්නසේකර මහතා, නන්දනී මිස් ඇතුළු ශිෂ්‍යශිෂ්‍යාවන් ද පුදුමයෙන් තමන් දෙස බලා සිටිනු ඇයට සිහිනෙන් මෙන් පෙනෙන්නට විය.

"තවත් ගැහැනියක්!" තිලකා සිහින් හඬින් මිමිණුවාය.


# IMMIGRATION LAW @
## Australian Immigration Law firm of the Sri Lankan Community

We are proud to have lead the way for others to follow...

## Professional Immigration Legal Services
Legal Advice in simple to complex Immigration matters

- Skill Assessments
- State Sponsorships Expression of Interest (EOI)
- Visa Lodgments
- Employer Sponsorships & Nominations
- Migration Review Tribunal Appeals
- Federal Court Appeals
- Ministerial Appeals

General Skill Migration
457 Visas
Employer Nominated Migration
Student Visas
Graduate Skill Visas
Permanent Residence Pathways
Spouse Visas
Contributory Parent Visas
Business Migration
Resident Return Visas

A Team of Qualified & Experienced Lawyers & Registered Migration Agents



**Susantha Katugampala**
Principal
Barrister & Solicitor
Accredited Immigration Law Specialist
MARN: 9601070

LAW INSTITUTE OF VICTORIA ACCREDITED SPECIALIST

FAIRFIELDS LAWYERS

AUSTRALIA GATEWAY
Australian Immigration Law Advisory

10 Morrison Place
East Melbourne 3002
Australia
T: 03 9650 4557
1300 888 331
M: 0417 851 041

Suite 602, Hilton Colombo
Residence 200
Union Place, Colombo 2
Sri Lanka
T: +94 11 2300 627
M:+94 777 347 670

info@fairfieldslawyers.com



We Deliver Results...